# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**බුද්ධ ධර්මය** කාලය පැය $01\frac{1}{2}$ යි.

නම / අංකය : ........................................................ **6 ශ්‍රේණිය**

### I කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) සිදුහත් බෝසතාණන්ට මනුලොව ඉපදීමට ආරාධනා කළේ,
 (i) සොත්ථිය බමුණාය.
 (ii) සටීකාර බ්‍රහ්මයාය.
 (iii) සහම්පති මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන්ය.

(02) පංච මහා විලෝකනයට අයත් වන්නේ කාලය, දීපය, දේශය, කුලය හා
 (i) ආගම ය. (ii) මව ය. (iii) පියා ය.

(03) මහාමායා දේවිය විසින් පුදුම උපදවන සිහිනය දකින ලද්දේ,
 (i) වෙසක් පෝය දිනකය.
 (ii) පොසොන් පෝය දිනයක.
 (iii) ඇසළ පෝය දිනකය.

(04) සුද්ධෝදන රජතුමාගේ ගුරුවරයා වූයේ,
 (i) සර්ව මිත්‍ර බමුණාය.
 (ii) අසිත බමුණාය.
 (iii) අස්සජි බමුණාය.

(05) සුද්ධෝදන පිය රජු තම පුතුට පළමුව වැන්දේ,
 (i) වප් මඟුල් දිනයේදීය.
 (ii) සිදුහත් කුමරුට නම් තබන ලද දිනයේදීය.
 (iii) සිදුහත් කුමරුට අසිත තාපසතුමා වැන්ද අවස්ථාවේදීය.

(06) සිදුහත් කුමරුට නම් තැබීම සඳහා පැමිණි බමුණන් ගණන වනුයේ,
 (i) 102 කි.
 (ii) 105 කි.
 (iii) 108 කි.

(07) මහාමායා දේවිය කලුරිය කළේ, කුමරු ඉපදි දින,
 (i) තුනකට පසුවය.
 (ii) පහකට පසුවය.
 (iii) හතකට පසුවය.

(08) යසෝදරා කුමරියගේ පියා වූයේ,
 (i) සුද්ධෝදන රජතුමාය.
 (ii) සුප්‍රබුද්ධ රජතුමාය.
 (iii) බිම්බිසාර රජතුමාය.

(09) වප් මඟුල් දින සිදුහත් කුමරා වඩනා ලද භාවනාව වනුයේ,
 (i) මෛත්‍රී භාවනාව.
 (ii) ආනාපානසති භාවනාව.
 (iii) බුද්ධානුස්සති භාවනාව.

(10) සිදුහත් තාපසයාණන්ගේ ගුරුවරයෙකු වන්නේ,
(i) අසිත බමුණාය.
(ii) සොත්ථිය බමුණාය.
(iii) උද්දකරාම පුත්ත බමුණාය.

(11) සිදුහත් තවුසාණන් දුෂ්කර ක්‍රියා කිරීම සඳහා ගත කළ කාලය වනුයේ,
(i) අවුරුදු හතරකි.
(ii) අවුරුදු හයකි.
(iii) අවුරුදු අටකි.

(12) පැවිදි වූ සිදුහත් කුමරුට සිවුරු පිරිකර පූජා කළේ,
(i) සටිකාර බ්‍රහ්මයා
(ii) ඡන්න ඇමති
(iii) සොත්ථිය බමුණා

(13) සිදුහත් බෝසතාණන්ට කුස තණ මිටි අටක් පූජා කළේ,
(i) සටිකාර බමුණා
(ii) සොත්ථිය බමුණා
(iii) භාරද්වාජ බමුණා

(14) නරසීහ ගාථා ප්‍රකාශ කළේ,
(i) කිසා ගෝතමිය
(ii) සුජාතා සිටු දේවිය
(iii) යසෝදරා

(15) පහත සඳහන් වචන අතරින් ශාසනික වචනය වන්නේ,
(i) අතුරුපස
(ii) ගිලන්පස
(iii) ආහාර

(16) ගිහි පුද්ගලයින් විසින් භාවිතා කරන පහත දක්වා ඇති වචන හතර සඳහා භාවිත කරන ශාසනික වචන අනුපිළිවෙළට දක්වා ඇති වරණය තෝරන්න.
අනුභව කරනවා, යනවා, නිදාගන්නවා, නානවා
(i) වළඳනවා, වඩිනවා, සැතපෙනවා, පැන් පහසු වෙනවා.
(ii) වළඳනවා, සැතපෙනවා, වඩිනවා, පැන් පහසු වෙනවා.
(iii) වළඳනවා, පැන් පහසු වෙනවා, සැතපෙනවා, වඩිනවා

(17) සිදුහත් කුමරුගේ බිසවගේ නම,
(i) යසෝදරා
(ii) විශාඛා
(iii) සුමනා

(18) මෙත් වැඩීමේ ආනිශංස ගණන,
(i) **05**
(ii) **08**
(iii) **11**

(19) ගිහිගෙය හැර යනවිට සිදුහත් කුමරුගේ වයස අවුරුදු,
(i) තිහකි.
(ii) දහසයකි.
(iii) විසි නවයකි.

(20) කම්මැලි නැතිකම යන අදහස ලබා දෙන පාලි වචනය වනුයේ,
(i) සුතං
(ii) අලීනතා
(iii) සීලං

(ලකුණු **2 x 20 = 40**)

## II කොටස

* ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.

(01)

(i) සිදුහත් කුමරුගේ දෙමව්පියන් නම් කරන්න. (ලකුණු 02)
(ii) සිදුහත් කුමරුජගේ සුළු මව කවුද? (ලකුණු 01)
(iii) සිදුහත් කුමරාගේ ගුරුවරයාගේ නම කුමක්ද? (ලකුණු 01)
(iv) සිදුහත් කුමරු උගත් ශිල්ප දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(v) නිබ්බුත පද ලියා දක්වන්න. (ලකුණු 04)

(02)

(i) සිදුහත් කුමරු උපන් අවස්ථාවේ සිදුවූ අසිරිමත් සිදුවීම් දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) සිදුහත් කුමරුගේ චරිතයෙන් පාසල් සිසුන්ට ලබාගත හැකි ආදර්ශ තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) "අග්ගෝ හමස්මි ලෝකස්ස................" යන ගාථාව නිවැරදිව ලියන්න. (ලකුණු 05)

(03)

(i) සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති අනු පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)
(ii) ත්‍රිවිද්‍යා නමින් හැඳින්වෙන ඥාන තුන නම් කරන්න. (ලකුණු 03)
(iii) පස්වග තවුසන් නම් කරන්න. (ලකුණු 05)

(04)

(i) විහාරස්ථානයට යන විට රැගෙන යන ද්‍රව්‍ය හතරක් ලියන්න. (ලකුණු 02)
(ii) විහාරස්ථානයට ගොස් වන්දනාමාන කරන අනුපිළිවෙළ ලියන්න. (ලකුණු 03)
(iii) බුදුගුණ සිහි කරන පාඨය ලියන්න. (ලකුණු 05)

(05)

(i) භාවනා කිරීමේදී පුරුෂ පක්ෂය හා ස්ත්‍රී පක්ෂය හිඳ ගන්නා ක්‍රම දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)
(ii) මෛත්‍රී භාවනාව වැඩීමට පෙර කළයුතු කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 02)
(iii) මෛත්‍රී භාවනාවේ ආනිශංස හයක් ලියන්න. (ලකුණු 06)

(06)

(i) රාහුල හිමිට පිරිනැමුණු අගතනතුර කුමක්ද? (ලකුණු 02)
(ii) රාහුල හිමි රහත් වූයේ කුමන සූත්‍ර දේශනාව අසාද? (ලකුණු 03)
(iii) රාහුල හිමිගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)

(07)

(i) ඔබගේ බුද්ධ ධර්මය පෙළ පොතෙහි අඩංගු දියුණුවට අදාළ ජාතක කතාව කුමක්ද? (ලකුණු 02)
(ii) එහි සඳහන් වන දියුණුවට හේතුවන කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) දියුණුවේ දොරටු හය ජීවිතය දියුණු කර ගැනීමට ඉවහල්වන ආකාරය ලියන්න. (ලකුණු 05)

***